# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2155/19 - 2019 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 10/2019 දරන සුරාබදු නිවේදනය

**ස්වභාවය වෙනස් නොකරන ලද පානීය සහ විකිණීම සඳහා අදහස් කරන බෝතල් ගත කරන ලද මත්පැන් අපනයනය**

කලින් කලට සංශෝධනය කරන ලද සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 22 වැනි වගන්තියෙහි (1) (අ) වැනි උපවගන්තිය යටතේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ විසින් සිදු කරනු ලබන නියෝගය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**නියමය**

සුරාබදු ආඥපනතේ 12 වැනි වගන්තිය යටතේ, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන අවසර පතක් මත කරන ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල්ගත කරන ලද මත්පැන් අපනයනය, සුරාබද්දක් ගෙවීම මත හෝ බදු රහිත පදනමක් මත එම භාණ්ඩ අපනයනය සඳහා ඇපකරයක් හෝ බැංකු ඇපයක් හෝ සැපයීම මත අවසර දෙන බව ද, එම ඇපකරය හෝ බැංකු ඇපය සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පිළිගත හැක්කක් විය යුතු බව ද මෙයින් නියම කරමි.

මෙම නිවේදනයේ කාර්යයන් සඳහා ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල්ගත කරන ලද මත්පැන් අපනයනකරුවන් සුරාබදු බලපත්‍රධාරීන් ලෙස සලකනු ලබන අතර, ඔවුන්ට නිෂ්පාදකයන්ගෙන් හෝ තොග වෙළෙන්දන්ගෙන් අපනයනය සඳහා ඔවුන්ගේ ඉහත සඳහන් ගණයට අයත් මත්පැන් මිළදී ගැනීමට අවසර දෙනු ලැබේ. අපනයනයකරුවන් බදු රහිත අනුග්‍රහයට හිමිකම් ලැබීමට ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා

1A - PG 4843 — 592 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බෝතල් ගතකරන ලද මත්පැන් අපනයනයෙන් දින 30ක් (තිහක්) ඇතුළත මෙහි උපලේඛනයේ යොමු කර ඇති සියලුම ලියකියවිලි සුරාබදු කොමසාරිස් ජනරාල් සෑහීමකට පත්වන පරිදි සැපයිය යුතුය. වක්‍ර අපනයනකරුවන් සම්බන්ධයෙන් පමණක් අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීමේ කාලසීමාව දින 60 (හැටක්) ක් වන්නේය. මෙලෙස ලියකියවිලි ඉදිරිපත් කිරීමට අසමත් වීමේදී අපනයනකරුවන් ඔවුන්ට පනවනු ලබන දඬුවම් කිසිවකට අමතරව, පවත්නා බදු ප්‍රමාණයන්ට අනුකූලව සුරාබදු ගෙවිය යුතු වන්නේය.

2011 ජුනි මස 21 වැනි දින අංක 1711/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 937 දරන සුරාබදු නිවේදනය පරිච්ඡින්න විය යුතුය.

මෙම නියෝගය 2019 දෙසැම්බර් මස 27 වැනි දින සිට බලපැවැත්වේ.

*උපලේඛනය*

1. අපනයනය කළ ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල්ගත කරන ලද මත්පැන් සඳහා ඉන්වොයිසියක්.

2. නෞභාරපත්‍රය හෝ ගගණ මාර්ග පත්‍රය, කෙසේ වුවද, ඕනෑම වක්‍ර අපනයනකරුවකුට දේශීය නිෂ්පාදිත මත්පැන් සැපයීම් ක්‍රියාවලියකදී, එම අපනයනකරුවන් විසින් ශ්‍රී ලංකාව මගින් මෙහෙයවනු ලබන ඕනෑම ජාත්‍යන්තර ගුවන් සේවාවකට දේශීය නිෂ්පාදිත මත්පැන් සැපයීමේදී, නෞභාරපත්‍රය හෝ ගගණ මාර්ග පත්‍රය වෙනුවට මෙහි ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි වන භාණ්ඩ භාර ගැනීම් සටහන් පත්‍රය පිළිගත යුතුය.

3. රේගු අපනයන පත්‍රය.

ඇමුණුම 01

### දේශීය භාණ්ඩ භාර ගැනීමේ සටහන (GRN)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වක්‍ර අපනයනකරුගේ නම | | අනුමැතිය අංකය | | GRN යොමු අංකය | | |
| අවසාන අපනයනකරුගේ නම හා ලිපිනය | | වෙනත් කරුණු: අමු ද්‍රව්‍ය භාවිතය හා නිරු බදු අගය හා අය විය යුතු වෙනත් බදු | | | | |
| පිරිවිතර සමග භාණ්ඩ වල විස්තර | | H.S. අංකය | ඒකකය නිරපේක්ෂ ලීටර | ප්‍රමාණය නිරපේක්ෂ ලීටර/ ඒකකය | මිල රු. | නිෂ්පාදන බදු |
| 1<br>2<br>3<br>4<br>5 | | | | | | |
| | | | එකතුව | | | |
| ඒකකය | | ප්‍රමාණය | බැදුම්කර/TIEP/අනුමැතිය | | | |
| 1<br>2<br>3<br>4<br>5 | | | අපගේ ........... සිටි කර්මාන්තශාලාව/ බන්ධිත ගුදම සඳහා ............. දින GRNහි විස්තර කර ඇති දේශීයව නිෂ්පාදනය කරන ලද භාණ්ඩ මිලදී ගත් බව හා අප වෙත ලැබී ඇති බව ................ (සැපයුම් අපනයනකරුගේ නම) විසින් සහතික කර සිටින්නෙමු. මෙම දේශීයව නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සම්පූර්ණයෙන්ම අපනයනය සඳහා යොදාගනු ලබන බවට අප විසින් වග බලා ගන්නෙමු. කෙසේ නමුත් පරිදි වෙනුවට භාර කර ඇති බව/ අදාල විස්තර සමග ......... (දින) ට පෙර එදිනට පෙර බැංකු ඇපකරය ලියාපදිංචි කිරීමටත් සමගින් බලය ලබාදෙනු ලැබේ. මේ සමග සපයනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් නිරු බදු අපසු ගෙවීම සඳහා ඉල්ලීම් කරනු නොලැබේ. | | | |
| ඉහත භාණ්ඩ ඇණවුමෙහි භාණ්ඩ ලබාගනු ලැබීය | | | රේගු දෙපාර්තමේන්තුව | | ශ්‍රී ලංකා රේගුවේ ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ ඒකකය | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය |
| සමාගමේ නම : ..........................<br>තනතුර : ............... නම: ....................<br>අත්සන : .................... දිනය :................ | | | බලයලත් නිලධාරීගේ අත්සන : ............<br>තනතුර : .......................<br>අත්සන : .......................<br>දිනය : .......................... | | බලයලත් නිලධාරීගේ<br>නම: .........<br>තනතුර: .........<br>අත්සන: .........<br>දිනය :............ | බලයලත් නිලධාරීගේ<br>නම: .........<br>තනතුර: .........<br>අත්සන: .........<br>දිනය :............ |

අඳුරැකළ කොටස අවසාන අපනයනකරුගේ ප්‍රයෝජනය සඳහා

* දින 30 කට නොවැඩි විය යුතුයි.

01 - 673

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.